# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,323 - 2023 මාර්තු මස 10 වැනි සිකුරාදා - 2023.03.10

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 364 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 366 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 373 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 මාර්තු මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

363 B 082435— 403 (2023/03)

## වෙනත් පත් කිරීම්

2023 අංක 146

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

බන්ධනාගාර ආඥාපනත යටතේ පත්වීම

**බන්ධනාගාර නිරීක්ෂණ මණ්ඩලය**

බන්ධනාගාර ආඥාපනතේ 35(1) වන වගන්තියෙන් මා වෙත පැවරුණ බලතල ප්‍රකාර අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මම 2023 මාර්තු මස 10 සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා පහත නම් සඳහන් පුද්ගලයින් බන්ධනාගාර නිරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත් කරමි.

| *නම* | *ලිපිනය* |
|---|---|
| 1. රණවක සුනිල් පෙරේරා මහතා | අංක 43/11, වලව්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ. |
| 2. සංජය ලීලාරත්න කංකානමගේ මහතා | අංක 143/බී, කනත්ත පාර, තලපත්පිටිය, නුගේගොඩ. |
| 3. විජිත උදයකාන්ත සෙනෙවිරත්න මහතා | අංක 113, දෙපානම, පන්නිපිටිය. |
| 4. මහේෂ් සමිත කළුගම්පිටිය මහතා | ෆ්‍රැන්ක්ෆට් වත්ත, ඉඹුල්ගොඩ. |
| 5. වෛද්‍ය අලුත්ගේ සමිත් දර්ශන පෙරේරා | අංක 230, ගාලුපාර, කොළඹ 04. |
| 6. රාජපක්ෂ කංකානම්ගේ හඩ්සන් රාජපක්ෂ මහතා | අංක 365/5, පන්සල පාර, තලවතුගොඩ. |
| 7. සහන්තිනි ධම්මිකා රත්නායක මහත්මිය | අංක 398/3, ජයමාවත, කලපළුවාව, රාජගිරිය. |

ජනාධිපති නීතිඥ, ආචාර්ය විජයදාස රාජපක්ෂ,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 ක් වූ පෙබරවාරි මස 27 වැනි දින,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

03-131

---

2023 අංක 147

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

බන්ධනාගාර නිරීක්ෂණ මණ්ඩලය

**ප්‍රාදේශීය වීක්ෂණ කමිටු**

බන්ධනාගාර ආඥාපනතේ 35(1) වන වගන්තියෙන් මා වෙත පැවරුණ බලතල ප්‍රකාර අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මම 2023 මාර්තු මස 10 සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා පහත නම් සඳහන් පුද්ගලයින් බන්ධනාගාරයන් හි ප්‍රාදේශීය වීක්ෂණ කමිටු සාමාජිකයින් ලෙස පත් කරමි.

| *නම* | *ලිපිනය* |
|---|---|
| **වැලිකඩ බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටුව** | |
| 1. ප්‍රියන්ත ඉන්දික කහපොලආරච්චි මහතා | අංක 171/2, දෙල්ගහවත්ත පාර, අංගොඩ. |
| 2. පූජ්‍ය විහාරගල විජය කීර්ති හිමි | අංක 73/50, විමලාරාමය, කිරුළපන, කොළඹ 05. |
| 3. නීතිඥ විදුර මංචනායක මහතා | අංක 123, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ. |
| 4. පතිරාජ වඩුගේ සුනිල් ලංකා මහතා | අංක 64/64, සංඝමිත්තා මාවත, කොටහේන, කොළඹ 13 |

**මැගසින් බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටුව**

| | | |
|---|---|---|
| 1. | විජිත කදිරගොන්න මහතා | J/U/GI, ගුණසිංහ පුරය, පූර්වාරාම මාවත, කොළඹ 12. |
| 2. | මුත්තන්ත්‍රිගේ දොන් තිලක් චමින්ද කුමාර මහතා | අංක 244/6, නවගමුව, රනාල. |
| 3. | මුත්තුලිංගම් නන්දකුමාර මහතා | අංක 105/78, වින්සන් පෙරේරා මාවත, කොළඹ 14. |
| 4. | ශාස්ත්‍රපති වතුකන්දේ දේවමිත්ත හිමි | අංක 34, ධර්මරාජ විහාරය, ජය මාවත, රත්මලාන. |

**කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටුව**

| | | |
|---|---|---|
| 1. | අජිත් ගුණසිංහ මහතා | අංක 33/14 ඒ, ඇඹුල්දෙනිය, නුගේගොඩ. |
| 2. | එම්. පුෂ්පකුමාර මහානාම මහතා | අංක 41/15, උඩහමුල්ල පාර, ගංගොඩවිල, නුගේගොඩ. |
| 3. | පූජ්‍ය පොල්ගහ කුඹුරේ විපුලතිස්ස හිමි | ශ්‍රී නාගරුක්ඛාරාම පුරාණ විහාරස්ථානය, කොටිකාවත්ත. |
| 4. | රණවීරගේ සජීවිකා ඔශාන්ති පෙරේරා මහත්මිය | අංක 195/1, ශ්‍රී සංඝරාජ පාර, කළුබෝවිල. |

**හෝමාගම වටරැක බන්ධනාගාරය සඳහා කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. | නිරෝෂන් ප්‍රසන්න හේවගේ මහතා | අංක 169, දාම්පේ, මීගොඩ. |
| 2. | කත්‍රිආරච්චිගේ දෝන රත්සිරි කත්‍රිආරච්චි මහතා | සංගිය ලබුගම පාර, හංවැල්ල. |
| 3. | හේරත් මුදියන්සේලාගේ රංබණ්ඩා මහතා | අංක 66/බී, කුවාකන්ද පාර, හංවැල්ල. |
| 4. | නාලන්දේ ප්‍රඥාරාම හිමි | ලෙනගල පුරාණ රජමහා විහාරය, වැලිපිල්ලෑව, දැඩිගමුව, හෝමාගම. |

**අනුරාධපුරය බන්ධනාගාරය සඳහා කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. | රාජපක්ෂ මුදියන්සේලාගේ උදය කුමාර විජේරත්න මහතා | අංක 611, 11 වන පියවර, බුලංකුලම, දිසා මාවත, අනුරාධපුරය. |
| 2. | රාජපක්ෂ සිරිමල්ගේ වික්‍රමසිංහ රාජපක්ෂ මහතා | අංක 10/3/S, නුවර වැව වත්ත, මිහින්තලා පාර, යාපනේ හංදිය, අනුරාධපුරය. |
| 3. | නීතිඥ සජීව ප්‍රදීප් කුමාර ගුණරත්න මහතා | අංක 394/27/ඒ, මුදිතා මාවත, පළමු පියවර, අනුරාධපුර. |
| 4. | එම්. කේ. කෝසල නිරෝෂන් ද සිල්වා මහතා | මාතලේ පාර, කුරුන්දන්කුලම, අනුරාධපුරය. |

**මීගමුව බන්ධනාගාරය සඳහා කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. | සෙන්බකුට්ටි ආරච්චිගේ සුජීව ලලිත් සිල්වා ගුණවර්ධන මහතා | අංක 151/සී, මැඩමුල්ල, මිනුවන්ගොඩ. |
| 2. | නීතිඥ රුවිල රන්දෙණිය | මොහොට්ටි මුල්ල, දංකොටුව. |
| 3. | ඉන්දික ගුරුසිංහ මහතා | රම්‍යා නිවාස, මීගමුව පාර, දූනගහ. |
| 4. | උදාර ද සිල්වා මහතා | අංක 249/බී, මීරිගම පාර, මීගමුව. |

ජනාධිපති නීතිඥ, ආචාර්ය විජයදාස රාජපක්ෂ,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

03-132

# රජයේ නිවේදන

## කර්මාන්ත අමාත්‍යාංශය

### සමිති අඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. අනුරාධපුරය, කටුකැලියාව, මඩගම්මන මාවත, සද්ධාතිස්සරාමය මහාවිහාරය දරන ස්ථානයේ පිහිටි "ශ්‍රී ලංකා විද්වත් වෘත්තීක උපදේශකවරුන්ගේ ජාතික ආයතනය" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි; සහ

02. ඒ ආඥාපනතෙ හි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය රමේෂ් පතිරණ,
කර්මාන්ත අමාත්‍ය.

2023 පෙබරවාරි මස 10 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1,
ගාලු පාර,
කොළඹ 03.

03-135

---

## කර්මාන්ත අමාත්‍යාංශය

### සමිති අඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. කඩුවෙල, වැලිවිට, අංක 73/5A, රුවන් සෙවණ දරන ස්ථානයේ පිහිටි "මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ විද්‍යාර්ථයින්ගේ සංගමය" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි; සහ

02. ඒ ආඥාපනතෙ හි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය රමේෂ් පතිරණ,
කර්මාන්ත අමාත්‍ය.

2023 පෙබරවාරි මස 21 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1,
ගාලු පාර,
කොළඹ 03.

03-136

**කර්මාන්ත අමාත්‍යාංශය**

සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණ බලතල ප්‍රකාර, කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. අනුරාධපුරය, කටුකැලියාව, මඩගම්මන මාවත, සද්ධාතිස්සරාමය මහාවිහාරය දරන ස්ථානයේ පිහිටි "සද්ධාතිස්සරාමය ඩිවලොප්මන්ට් ෆවුන්ඩේෂන්" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙ හි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි; සහ

02. ඒ ආඥාපනතෙ හි 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය රමේෂ් පතිරණ,
කර්මාන්ත අමාත්‍ය.

2023 පෙබරවාරි මස 10 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1,
ගාලු පාර,
කොළඹ 03.

03-137

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/111/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙ හි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙ හි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2023.03.10** වැනි දින සිට **2023.03.24** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2023.03.31** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

## උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දෙහි CON/SP/05/03-04 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ දෙහිවල පළාත් පාලන ඡන්ද කොට්ඨාසයේ හා ග්‍රාම සේවක කොට්ඨාසයේ වැන්ඩර්වර්ට් පෙදෙස ග්‍රාමයේ කින්ස්ටන් කෝට් නිවාස යෝජනා ක්‍රමයේ "ඇපොතිකරියාවත්ත " නැමැති ඉඩමට මහල් 1 සඳහා බලයලත් මානක කේ. කනගසිංගම් මහතා විසින් 2010.09.10 දින මැන සාදන ලද අංක 2056 දරන පිඹුරේ වර්පනම් අංක 28-1/1 බිම් කට්ටි අංක 5232 සඳහා මායිම්,<br><br>*උතුරට* : CE 4 හා CE 23 හි විවෘත ඉඩකඩ සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මධ්‍යය.<br><br>*නැගෙනහිරට* : CE 3 විවෘත ඉඩකඩ හා FF 2, CE 4, CE 23 විවෘත ඉඩකඩ හා මෙම ඒකකය අතර බිත්තියේ මධ්‍යය.<br><br>*දකුණට* : CE 3, CE 22 හි විවෘත ඉඩකඩ හා මෙම ඒකකය අතර බිත්තියේ මධ්‍යය.<br><br>*බස්නාහිරට* : CE 3, CE 22 හි විවෘත ඉඩකඩ හා මෙම ඒකකය අතර බිත්තියේ මධ්‍යය සහ මෙම ඒකකයේ බිත්තියත් ලොට් D ව. අ. 30 වැන්ඩර්වර්ට් පෙදෙස වෙන්වන මධ්‍යය.<br><br>*පතුල* : SF 1ට ඉහලින් කොන්ක්‍රීට් බිමේ මධ්‍යය.<br><br>*මුදුන* : CE 3 හා CE 4 හි විවෘත ඉඩකඩ හා CE 8, CE 15ට ඉහලින් ඇති මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමේ මධ්‍යය.<br><br>බිම් ප්‍රමාණය : ව. මී. 95.23 වර්ග අඩි 1,025 | 01. ආර්. රගුරාජා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2010.12.18 දින ලියා සහතික කරන ලද අංක 3,182 දරන ප්‍රකාශන ඔප්පුවයි.<br><br>02. ආර්. රගුරාජා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2011.02.23 දින ලියා සහතික කරන ලද අංක 3,296 දරන විකුණුම් ඔප්පුවයි. |

03 - 138

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/100/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2023.03.10** වැනි දින සිට **2023.03.24** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2023.03.31** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 613 වෙළුමේ, 54 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කොට්ටාව පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. පී. ඒ. ජයසිංහගේ මහතා විසින් අංක 2671 සහ 1965.09.09 මැන සාදන ලද ලොට් 02 සඳහා මායිම්, <br>*උතුරට* : අංක 2,671 ප්ලෑනයේ සඳහන් අංක 3 දරන කොටස, <br>*නැගෙනහිරට* : කත්‍රි අච්චිගේ කුඹුර ද, <br>*දකුණට* : මඩුගහ වත්ත ද, <br>*බස්නාහිරට* : අංක 2,671 දරන පිඹුරේ සඳහන් අංක 5 දරන කොටස. <br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 20. | 01. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.09.18 දින ලියා සහතික කරන ලද අංක 31535 දරන තෑගි ඔප්පුව. <br>02. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.06.25 දින ලියා සහතික කරන ලද අංක 39598 දරන තෑගි ඔප්පුව. <br>03. එල්. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.09.25 දින ලියා සහතික කරන ලද අංක 4088 දරන විකුණුම් ඔප්පුවයි. |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 613 වෙළුමේ, 55 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම කෝරළේ, කොට්ඨාව පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. පී. ඒ. ජයසිංහගේ මහතා විසින් අංක 2671 සහ 1965.09.09 මැන සාදන ලද ලොට් 03 සඳහා මායිම්,<br><br>*උතුර නැගෙනහිරට* : *උතුර බටහිරට* : } අංක 2671 ප්ලෑනයේ සඳහන් අංක 5 දරන කොටස.<br><br>*දකුණ* : කත්‍රි අච්චිගේ කුඹුර ද, *නැගෙනහිර*<br><br>*දකුණ බ.* : අංක 2,671 දරන පිඹුරේ සඳහන් අංක 2 දරන කොටස.<br><br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 20. | 01. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.09.17 දින ලියා සහතික කරන ලද අංක 31535 දරන තෑගි ඔප්පුව.<br><br>02. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.06.09 දින ලියා සහතික කරන ලද අංක 39598 දරන තෑගි ඔප්පුව.<br><br>03. ඩබ්. එල්. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.09.25 දින ලියා සහතික කරන ලද අංක 4088 දරන විකුණුම් ඔප්පුවයි. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 613 වෙළුමේ, 56 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කොට්ටාව පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. පී. ඒ. ජයසිංහගේ මහතා විසින් අංක 2671 සහ 1965.09.09 මැන සාදන ලද ලොට් 04 සඳහා මායිම්,<br><br>*උතුරට* : කොල්ලු කනත්ත,<br><br>*නැගෙනහිරට* : ඩී. ජුලියට් පෙරේරාට අයිති එගොඩ වත්ත ද,<br><br>*දකුණට* : අංක 2671 දරන පිඹුරේ සඳහන් අංක 5 දරන කොටස,<br><br>*බස්නාහිරට* : අංක 2,671 දරන පිඹුරේ සඳහන් අංක 1 දරන කොටස.<br><br>බිම් ප්‍රමාණය : අ.00, රූ.03, පර්. 35. | 01. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.09.18 දින ලියා සහතික කරන ලද අංක 31535 දරන තෑගි ඔප්පුව.<br><br>02. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.06.09 දින ලියා සහතික කරන ලද අංක 39598 දරන තෑගි ඔප්පුව.<br><br>03. ආර්. ඒ. ගමලත් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.01.19 දින ලියා සහතික කරන ලද අංක 1634 දරන විකුණුම් ඔප්පුවයි. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 613 වෙළුමේ, 57 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කොට්ටාව පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. පී. ඒ. ජයසිංහගේ මහතා විසින් අංක 2671 සහ 1965.09.09 මැන සාදන ලද ලොට් 05 සඳහා මායිම්, | 01. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.09.18 දින ලියා සහතික කරන ලද අංක 31535 දරන තෑගි ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුරට* : මෙම පිඹුරේ සඳහන් අංක 4 දරන කොටස,<br>*නැගෙනහිරට* : එම සහ ඩී. ජුලියට් පෙරේරාට අයිති එගොඩ වත්ත ද,<br>*දකුණට* : කත්‍රි අච්චිගේ කුඹුර ද 2671 දරන පිඹුරේ සඳහන් අංක 3 සහ 2 සහ මඩු ගහ වත්ත ද,<br>*බස්නාහිරට* : අංක 2671 පිඹුරේ සඳහන් අංක 3 සහ 1 දරන කොටස.<br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 10. | 02. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.06.09 දින ලියා සහතික කරන ලද අංක 39598 දරන තෑගි ඔප්පුවයි.<br>03. එල්. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.09.25 දින ලියා සහතික කරන ලද අංක 4088 දරන විකුණුම් ඔප්පුවයි.<br>04. ආර්. ඒ. ගමලත් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.01.19 දින ලියා සහතික කරන ලද අංක 1634 දරන විකුණුම් ඔප්පුවයි. |

03 - 139

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/56/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2023.03.10** වැනි දින සිට **2023.03.24** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2023.03.31** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මීග/මීරි කොට්ඨාසයේ 04 වෙළුමේ 436 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 23, වේරගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වේරගොඩ පිහිටි "කරාදෙනිය කන්ද" නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක ගම් 1016 දරන පිඹුරේ ගම්/ප්‍ර 9297 දීමනා පත්‍රයේ 1987.02.10 දිනැති කැබලි අංක 15 දරන ඉඩමට මායිම්,<br><br>*උතුරට* : කට්ටි අංක 14 හා ප්‍රවේශ මාර්ගය.<br><br>*නැගෙනහිරට* : කට්ටි අංක 16,<br><br>*දකුණට* : මු.පි.ඒ. 286/18,<br><br>*බස්නාහිරට* : කට්ටි අංක 14.<br><br>බිම් ප්‍රමාණය : අක්. 00, රූඩ්. 00, පර්. 00, හෙක්. 0.445 | 01. ජනාධිපති ලේකම් විසින් 1987.02.10 දින ප්‍රදානය කරන ලද අංක ගම්/ප්‍ර 9297 දරන දීමනාපත්‍රය.<br><br>02. ප්‍රාදේශීය ලේකම් විසින් 1996.03.26 දින අංක ගම්/ප්‍ර 9297 දරන අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ ලේඛනය. |

03 - 140

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/107/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙ හි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙ හි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2023.03.10** වැනි දින සිට **2023.03.24** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2023.03.31** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 570 වෙළුමේ 158 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, කළපළුවාව පිහිටි "කැබැල්ලගහවත්ත *හෙවත්* තුන්හවුල් කැබැල්ලගහවත්ත ලොට් A මස B" නැමති ඉඩම සඳහා මායිම්,<br>*උතුරු නැගෙනහිර* : ලොට් ජී,<br>*දකුණු නැගෙනහිර* : අමරසිංහගේ දාවිත් පෙරේරාට අයිති කුඹුර,<br>*දකුණු බස්නාහිරට* : දැනට ඇල්බට් බොතේජුට අයිති ඉඩම,<br>*උතුරු බස්නාහිර* : පාර.<br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 18. | 01. ඩී. වෙත්තසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.12.04 දින ලියා සහතික කරන ලද අංක 1345 දරන විකුණුම් ඔප්පුව.<br>02. එස්. ආර්. ආටිගල ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1990.03.01 දින ලියා සහතික කරන ලද අංක 113 දරන විකුණුම් ඔප්පුව.<br>03. එස්. එස්. ගුණරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.10.02 දින ලියා සහතික කරන ලද අංක 493 දරන විකුණුම් ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 255 වෙළුමේ 27 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, කළපළුවාව පිහිටි "කැබැල්ලගහවත්ත *හෙවත්* තුන්හවුල් කැබැල්ලගහවත්ත ලොට් A මස B" නැමති ඉඩම සඳහා මායිම්,<br>*උතුරු නැගෙනහිර* : ලොට් ජී,<br>*දකුණු නැගෙනහිර* : අමරසිංහගේ දාවිත් පෙරේරාට අයිති කුඹුර,<br>*දකුණු බස්නාහිරට* : දැනට ඇල්බට් බොතේජුට අයිති ඉඩම,<br>*උතුරු බස්නාහිර* : පාර.<br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 18. | 01. ඩී. වෙත්තසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1970.05.07 දින ලියා සහතික කරන ලද අංක 424 දරන විකුණුම් ඔප්පුව. |

03 - 141

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - අකුරැස්ස ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණයදෙනුකරුගේ නම : බෙල්ලන ආචාරිගේ ටචිත් එෂාන් සහ බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2023.01.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනාව සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත කී බෙල්ලන ආචාරිගේ ටචිත් එෂාන් සහ බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන් යන අය "බන්ධනදායීන්/උකස්කරුවන්" ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. එම්. එම්. කේ. කාරියවසම් විසින් ලියා සහතික කරන ලද වර්ෂ

2020.12.02 වැනි දිනැති අංක 601 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 601 දරන උකස්කරය මත,

වර්ෂ 2022.10.17 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් විසි පන් මිලියන නව ලක්ෂ හැට එක් දහස් තුන්සිය පනස් තුනයි ශත හතළිස් දෙක (රු. 25,961,353.42)ක මුදලක් ද, සහ වර්ෂ 2022.10.18 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් විසි හතර මිලියන එක් ලක්ෂ අනූ දෙදහස් විසි දෙකයි ශත පනස් දෙක (රු. 24,192,022.52)ක් දක්වා වූ මුදල මත වර්ෂයට 14%ක පොළිය ද, ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් විසි පන් මිලියන නව ලක්ෂ හැට එක් දහස් තුන්සිය පනස් තුනයි ශත හතළිස් දෙක (රු. 25,961,353.42)ක මුලු මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදිය, අංක 200 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් හතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාතර මහනගර සභා සීමාවේ, කොටුවේගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොටුවේගොඩ පිහිටි පරණ තංගල්ල පාරේ, වරිපනම් අංක 243/1 අයත් බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රශ්මි විසින් මැන සාදන ලද වර්ෂ 2013.07.23 දිනැති අංක 4215 දරන පිඹුරෙහි දැක්වෙන "ලොට් 2A ජුල්ගහවත්ත" උතුරින් : පිඹුරු අංක 3236හි ලොට් 01 (වරිපනම් අංක 243/2 දරන) ද, නැගෙනහිරට : දැවපන්නේ වලව්වේ වත්ත ද, දකුණට : ලොට් 2B, 2C සහ 2D ද, සහ බස්නාහිරට : පිඹුරු අංක 3236 හි ලොට් 3 (අඩි 10ක් පළල පාර) යන මායිම් වූ තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හතරයි හය (පර්. 11.46)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රශ්මි විසින් මැන සාදන ලද 2009.06.20 දිනැති අංක 3236 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 (අඩි 10ක් පළල පාර) මතින් සහ ඔස්සේ වන මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණි,
ණය අයකර ගැනීම්.

03-148

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - හොරණ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණුණුදෙනුකරුගේ නම : ජයලත් බලගල්ලගේ නිමන්ත නයනජිත් ඩයස්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 26 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී ජයලත් බලගල්ලගේ නිමන්ත නයනජිත් ඩයස් යන අය "බන්ධනදායී/උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. අල්මේදා විසින් ලියා සහතික කරන ලද 2019.11.14 දිනැති අංක 1364 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1364 දරන උකස්කරය මත,

01. වර්ෂ 2022.10.17 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හැට හත් ලක්ෂ පනස් තුන් දහස් අටසිය හතළිස් හයයි ශත හැත්තෑ තුන (රු. 6,753,846.73)ක මුදලක් ද, වර්ෂ 2022.10.18 වැනි දින සිට රු. 6,102,106.26ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

02. වර්ෂ 2022.10.17 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් අසූ නව දහස් දෙසිය පනස් අටයි ශත අසූව (රු. 89,258.80)ක මුදලක් ද, වර්ෂ 2022.10.18 වැනි දින සිට රු. 87,478.46ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 8.05%ක පොළිය ද,

03. වර්ෂ 2022.10.17 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පන් ලක්ෂ අනූ දෙදහස් එකසිය හැට දෙකයි ශත හැත්තෑ තුන (රු. 592,162.73)ක මුදලක් ද, වර්ෂ 2022.10.18 වැනි දින සිට රු. 544,699.87ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 26.75%ක පොළිය ද,

ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී සම්පූර්ණ මුදල වන රුපියල් හැත්තෑ හතර ලක්ෂ තිස් පන් දහස් දෙසිය හැට අටයි ශත විසි හය (රු. 7,435,268.26)ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසි දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 483/2ඒ, ගොඩගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයට ගොඩගම ගමේ පිහිටා ඇති කොට්ඨාස අංක 7, 4 වන පටුමග, පැල්පොලවත්ත, තැපැල් අංක 66/1 සහ වරිපනම් අංක 42 "මුත්තෙට්ටුවේහේනවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. නිලුපුල් ආර්. කරුණාතිලක විසින් මැන සාදන ලද වර්ෂ 2019.03.24 වැනි දිනැති අංක 3996 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 90 දරන ඉඩම් කොටසට මායිම් (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. වීරකෝන් බණ්ඩා විසින් මැන සාදන ලද වර්ෂ 1992.09.06 වැනි දිනැති අංක 171 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් X දරන ඉඩම් කොටස සහ කැඩැස්තර් සිතියම් අංක 520017 හි කැබලි අංක 15හි ලොට් 90 හි නැවත මැනීමකි). උතුරට : එකී CM520017/15 හි ලොට් 80 ද, නැගෙනහිරට : එකී CM520017/15 හි ලොට් 89 ද, දකුණට : CM520017/15 හි ලොට් 95 (ප්‍රාදේශීය සභා පාර) ද සහ බස්නාහිරට : එකී CM520017/15 හි ලොට් 244 ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම තුනක් (පර්. 24.3) *හෙවත්* හෙක්ටයාර් 0.0615ක් විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි, වගාවන් සහ සෑම සියලු දේද සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1003/01 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ලොට් 90 ඉඩම පහත විස්තර වන ඉඩමේ නැවත සිදුකළ මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, ගොඩගම ගමේ පිහිටා ඇති "මුත්තෙට්ටුවේහේනවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. වීරකෝන් බණ්ඩා විසින් මැන සාදන ලද වර්ෂ 1992.09.06 වැනි දිනැති අංක 171 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් X දරන ඉඩම් කොටසට මායිම් (ඉහත සඳහන් ලොට් X දරන ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1991.08.10 වැනි දිනැති අංක 532 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් B සහ බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් මැන සාදන ලද වර්ෂ 1991.02.10 වැනි දිනැති අංක 4023/2 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 2A හි ඉතිරි කොටස ද ඒකාබද්ධ කරන ලද්දකි). උතුරට : අලුත්ගේ මේරිනෝනා යන අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : මෙහි ලොට් Y ද, දකුණට : පාර (ප්‍රාදේශීය සභා) ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1991.08.10 වැනි දිනැති අංක 532 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් A ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහ (පර්. 25) *හෙවත්* හෙක්ටයාර් 0.06323ක් විශාලත්වය ඇති ඉඩම සහ සෑම සියලු දේද සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 108/20හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
ජ්‍යෙෂ්ඨ කළමණාකාරිණී,
ණය අයකර ගැනීම්.

03-147

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2022 දෙසැම්බර් මස 21 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. බඳුගේ විසින් ලියා සහතික කරන ලද 2016.03.15 දිනැති දිනපොත් අංක 4/1167, 2017.05.05 දිනැති දිනපොත් අංක 4/2261, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද 2020.02.18 දිනැති දිනපොත් අංක 4/998 සහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග විසින් ලියා සහතික කරන ලද 2021.04.19 දිනැති දිනපොත් අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, රත්මලානේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 74832 දරන නිව් පැල් පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2022 අගෝස්තු මස 31 වැනි දිනට එකී නිව් පැල් පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී දිනපොත් අංක 4/1167, අංක 4/2261, අංක 4/998 සහ අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත රුපියල් දස කෝටි පනස් ලක්ෂ හැත්තෑ අටදහස් පනස් දෙකයි ශත විසි පහක (රු. 105,078,052.25) මුදලක් ද, 2022 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දෙලක්ෂ හැත්තෑ හත් දහස් හත්සිය හැත්තෑ හයක (රු. 277,776.00) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) ක් බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, රුපියල් දහ අට ලක්ෂ හැට දෙදහස් පනස් හතරයි ශත අනූ දෙකක (රු. 1,862,054.92) මුදල මත ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට පහක් (5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් හය කෝටි එකොළොස් ලක්ෂ හතලිස් හතර දහස් නවසිය අනූ අටයි ශත හතලිස් හතරක (රු. 61,144,998.44) මුදල මත පවත්නා අනුපාතය අනුව සතියකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම හතයි පහක් (6.75%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් තුන් කෝටි හතලිස් තුන් ලක්ෂ එකසිය පනස් දෙකක (රු. 34,300,152.00) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම සතියකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, සහ 2022 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී නිව් පැල් පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී දිනපොත් අංක 4/1167, අංක 4/2261 සහ අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත රුපියල් දහ හත් ලක්ෂ විසි එක් දහස් හත්සිය විසි එකයි ශත පනස් පහක (රු. 1,721,721.55) මුදලක් ද, 2022 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දහ හත් ලක්ෂ විසි එක් දහස් හත්සිය විසි එකයි ශත පනස් පහක (රු. 1,721,721.55) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තවද, එකී මුදල වන රුපියල් දස කෝටි පනස් ලක්ෂ හැත්තෑ අට දහස් පනස් දෙකයි ශත විසි පහක (රු. 105,078,052.25) මුදලක් ද, 2022 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දෙලක්ෂ හැත්තෑ හත් දහස් හත්සිය හැත්තෑ හයක (රු. 277,776.00) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් දහ අට ලක්ෂ හැට දෙදහස් පනස් හතරයි ශත අනූ දෙකක (රු. 1,862,054.92) මුදල මත ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පලමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට පහක් (5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් හය කෝටි එකොළොස් ලක්ෂ හතලිස් හතර දහස් නවසිය අනූ අටයි ශත හතලිස් හතරක (රු. 61,144,998.44) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම සතියකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම හතයි

පහක් (6.75%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් තුන් කෝටි හතලිස් තුන් ලක්ෂ එකසිය පනස් දෙකක (රු. 34,300,152.00) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම සතියකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, සහ 2022 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී නිව් පැල් පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී දිනපොත් අංක 4/1167, අංක 4/2261 සහ අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත රුපියල් දහ හත් ලක්ෂ විසි එක් දහස් හත්සිය විසි එකයි ශත පනස් පහක (රු. 1,721,721.55) මුදලක් ද, 2022 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දහ හත් ලක්ෂ විසි එක් දහස් හත්සිය විසි එකයි ශත පනස් පහක (රු. 1,721,721.55) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 4/1167, අංක 4/2261, අංක 4/998 සහ අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මගින් අජිත් නිරංජන් ගෝනගල විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල, බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සිහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 4/1167, අංක 4/2261, අංක 4/998 සහ අංක 4/2434 (අංක 2530467 දරන හිමිකම් සහතිකය) දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 543B අත්තිඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අත්තිඩිය දකුණ ගමේ පිහිටි, කැඩැස්තර සිතියම් අංක 521002 හි කොට්ඨාස අංක 02 (Block No. 2) දැක්වෙන ඉඩම් කොටස් අංක 195 දරන (land parcel 195) දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: 154 කොටස ද නැගෙනහිරට: 196 කොටස ද, දකුණට : පාරද සහ බස්නාහිරට: 194 කොටස ද වශයෙන් මායිම් වූ එකී කැඩැස්තර සිතියම් අංක 521002 අනුව ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි තුනයි පහයි අටක් (හෙක්. 0.1358) විශාල ඉඩම වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 2530467 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

03-184

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2022 දෙසැම්බර් මස 21 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ෆොන්සේකා විසින් සියල්ල ලියා සහතික කරන ලද 2017.10.24 දිනැති අංක 1367 සහ 1369, 2019.07.17 වැනි දිනැති අංක 1785 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, කැළණියේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV99334 යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද නෙම්කෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් ( මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2022 අප්‍රේල් මස 30 වැනි දිනට එකී නෙම්කෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 1367, 1369 ස 1785 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් තුන් කෝටි පනස් එක් ලක්ෂ හතලිස් දෙදහස් අටසිය තිස් පහයි ශත තිස් හයක (රු. 35,142,835.36) මුදලක් ද, 2022 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි අනූ පන් ලක්ෂ දස දහස් තුන්සිය හැට හතක (රු. 19,510,367) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී

අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් විසි නව ලක්ෂ හතලිස් දහස් හාරසිය හැට හතරක (රු. 2,940,464) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධන කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ පනස් හය දහස් තුන්සිය හයයි ශත තිස් එකක (රු. 11,356,306.31) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම නවයයි තුනක් (8.93%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තවද එකී මුදල වන රුපියල් තුන් කෝටි පනස් එක් ලක්ෂ හතලිස් දෙදහස් අටසිය තිස් පහයි ශත තිස් හයක (රු. 35,142,835.36) මුදලක් ද, 2022 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි අනූ පන් ලක්ෂ දස දහස් තුන්සිය හැට හතක (රු. 19,510,367) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් විසි නව ලක්ෂ හතලිස් දහස් හාරසිය හැට හතරක (රු. 2,940,464) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ ප්‍රතිශෝධන කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ පනස් හය දහස් තුන්සිය හයයි ශත තිස් එකක (රු. 11,356,306.31) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම නවයයි තුනක් (8.93%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොලිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1367, 1369 සහ 1785 දරන උකස් බැඳුම්කරය් මගින් ගම්ලත් රළලාගේ චන්දන විජය කුමාර සේනාරත්න හෙවත් ගම්ලත්රාලලාගේ චන්දන විජය කුමාර සේනාරත්න *හෙවත්* චන්දන විජය කුමාර සේනාරත්න සහ නෙම්කෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම, ගොඩනැගිල්ල සහ තොග (Stocks) බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 1367 සහ 1785 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත 263 ඒ පිලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිලපිටිය ගමේ පිහිටි "රිටිගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් සාදන ලද 2016.10.18 වැනි දිනැති අංක 191/2016 දරන මැනුම් පිඹුරේ ලොට් 5ඒ5 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 322/1985 දරන පිඹුරේ ලොට් ඒ7 ද, නැගෙනහිරට : අංක 322/1985 දරන පිඹුරේ ලොට් ඒ6 ද, දකුණට : අංක 532/2007 දරන පිඹුරේ ලොට් ඒ5/1 ද, සහ බස්නාහිරට: නිහාල් ගුණසේකර ගේ ඉඩම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම දෙකයි පහක් (පර්. 14.25) විශාල ඉඩම එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමග වේ.

බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1985.09.08 දිනැති අංක 322/1985 දරන මැනුම් පිඹුරේ ලොට් ඒ6 වශයෙන් ලකුණු කරන ලද පාරක් සඳහා වූ වෙන් කිරීම (Road Reservation) භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ.

එකී ලොට් 5ඒ5 පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත 263ඒ පිලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිලපිටිය ගමේ පිහිටි "රිටිගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1985.09.08 වැනි දිනැති අක 322/1985 දරන මැනුම් පිඹුරේ ලොට් ඒ5 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කර ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 322/1985 දරන පිඹුරේ ලොට් ඒ7 ද, නැගෙනහිරට :අංක 322/1985 දරන පිඹුරේ ලොට් ඒ6 ද, දකුණට : අංක 322/1985 දරන පිඹුරේ ලොට් ඒ4 ද, සහ බස්නාහිරට : නිහාල් ගුණසේකර ගේ ඉඩම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (පර්. 15) විශාල ඉඩම එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමග වේ.

**අංක 1369 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

2017.09.28 වැනි දිනට තොග වෙළඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ ඇතුළත්ව සම්පූර්ණයෙන්ම

| **Ladies Department - කාන්තා අංශය** | | |
|---|---|---|
| *අයිතම අංකය* *Item No.* | *අයිතම නාමය* *Item Name* | *ප්‍රමාණය* *Qty* |
| 1 | බ්ලවුස් - Blouses | 2687 |
| 2 | ටී ෂර්ට් - T-Shirts | 1033 |
| 3 | ස්කර්ට් - Skirts | 1921 |
| 4 | ෆ්රොක් - Frocks | 457 |
| 5 | පැන්ට් - Pants | 893 |
| 6 | අන්ඩර්ස්කර්ට් - Underskirts | 202 |
| 7 | අන්ඩර් ෂෝට් - undershorts | 66 |
| 8 | බ්රා - Bras | 991 |
| 9 | ස්කිනිස් - Skineess | 290 |
| 10 | පැන්ටි - Panties | 233 |
| 11 | හැන්කි - Hankies | 61 |
| 12 | හෑන්ඩ් බෑග් - Hand Bags | 137 |
| 13 | ටයිට් ෂෝර්ට් - Tightshorts | 146 |
| 14 | ස්ටොකිංග්ස් - Stokings | 19 |
| 15 | සර්වියට් - Serviats | 264 |
| 16 | බෙඩ්ෂීට් - Bedsheets | 125 |
| 17 | ටවල් - Towels | 157 |
| **පිරිමි ළමා අංශය - Boys Department** | | |
| 1 | ෂර්ට් - Shirts | 350 |
| 2 | බොටම් - Bottoms | 105 |
| 3 | ට්‍රවුසර් - Trousers | 325 |
| 4 | ටී ෂර්ට්ස් - Tshirts | 795 |
| 5 | යුනිෆෝම් ෂර්ට් - Uniform Shirts | 268 |
| 6 | යුනිෆෝම් ෂෝර්ට් - Uniform Shorts | 224 |
| 7 | බේබි සූට් - baby suits | 725 |
| 8 | ස්කිනීස් - Skinees | 158 |
| 9 | නයිට් සූට් - Night Suits | 26 |
| 10 | අන්ඩර් වෙයාර් - Underwears | 105 |

| *අයිතම අංකය Item No.* | *අයිතම නාමය Item Name* | *ප්‍රමාණය Qty* |
|---|---|---|
| 11 | ෂෝර්ට් - Shorts | 388 |
| 12 | සොක්ස් - Socks | 326 |
| 13 | ටයි - Ties | 52 |
| 14 | වෙස්ට් - Wests | 110 |
| 15 | කැප් - Caps | 78 |
| 16 | ස්කූල් බෑග් - School bags | 68 |
| 17 | බෙල්ට් - Belts | 28 |
| 18 | ස්විමිං අයිටම්ස් - Swimming Items | 38 |
| 19 | බේබි ෂූස් -Baby Shoes | 26 |
| 20 | මොස්කිටෝ නෙට් - Mosquito Nets | 31 |
| 21 | රේන් කෝට් - Rain Coats | 21 |
| | මහතුන්ගේ අංශය - **Gents Department** | |
| 1 | ෂර්ට් - Shirts | 997 |
| 2 | ටී ෂර්ට් - T Shirts | 329 |
| 3 | කොටන් ට්‍රවුසර් - Cotton Trousers | 371 |
| 4 | ඩෙනිම් - Denims | 118 |
| 5 | අන්ඩර්වෙයාර් - Underwears | 198 |
| 6 | සරොම් - Sarrongs | 86 |
| 7 | බෙල්ට් - Belts | 11 |
| 8 | ටයි - Ties | 21 |
| 9 | ෂෝර්ට්ස් - Shorts | 71 |
| 10 | වෙස්ට් - Vests | 73 |
| 11 | කැෂුවල් ෂර්ට් - Casual Shirts | 176 |
| 12 | හැන්කීස් - Hankees | 11 |
| 13 | සොක්ස් - Socks | 131 |
| 14 | බොටම් - Bottoms | 9 |
| 15 | කිට් - Kits | 14 |
| 16 | රේන් කෝට් - Rain Coats | 4 |
| | ගැහැණු ළමුන්ගේ අංශය - **Girls Department** | |
| 1 | ෆ්‍රොක් - Frocks | 721 |
| 2 | යුනිෆෝම් ෆ්‍රොක් - Uniform Frocks | 549 |

| *අයිතම අංකය* *Item No.* | *අයිතම නාමය* *Item Name* | *ප්‍රමාණය* *Qty* |
|---|---|---|
| 3 | බ්ලවුස් - Blouses | 98 |
| 4 | ටී ෂර්ට්ස් - T shirts | 396 |
| 5 |ෆැන්ටි - Pants | 368 |
| 6 | පාටි ෆ්‍රොක් - Party Frocks | 156 |
| 7 | ෂෝර්ට් ස්කර්ට් - Short Skirts | 81 |
| 8 | පැන්ටි - Panties | 612 |
| 9 | ෂෝර්ට් ස්කර්ට් - Short Skirts | 60 |
| 10 | ෂොක්ස් - Shocks | 296 |
| 11 | පෙටි කෝට් - Pettycoats | 42 |
| 12 | ස්කර්ට් ඇන්ඩ් බ්ලවුස් - Skirt & Blouses | 89 |
| 13 | ටයිට් ජීන්ස් - Tight Jeans | 173 |
| 14 | කැප් - Caps | 620 |

| ළදරු අංශය - **Baby Department** | | |
|---|---|---|
| 1. | පැම්පර්ස් - Pampers | 22 |
| 2 | වූල් සෙට් - Wool Sets | 67 |
| 3. | පිලෝ කේස් - Pillowcases | 7 |
| 4 | නැපීස් - Nappies | 42 |
| 5. | බේබි කෙයාර් - Baby cares | 702 |
| 6. | බේබි හාඩ්වෙයාර් - Baby Hardwears | 361 |
| 7. | ටොයිස් - Toys | 565 |
| 8. | සොෆ්ට් ටොයිස් - Soft toys | 24 |

| ඔරලෝසු - **Watch** | | |
|---|---|---|
| 1. | වොච් ලේඩීස් - Watch Ladies | 39 |
| 2 | වොච් ජෙන්ට්ස් - Watch Gents | 46 |
| 3. | වොච් ලේඩීස් නිව් - Watch Ladies New | 8 |

| තෑගි අංශය - **Gift Department** | | |
|---|---|---|
| 1. | තෑගි - Gifts | 3,021 |
| 2 | සිල්වර් අයිතම් - Silver Items | 1,188 |
| 3. | ෆ්ලවර් - Flowers | 72 |
| 4. | සිල්වර් අයිතම - Silver Items | 200 |
| 5. | ඉලෙක්ට්‍රික් අයිතම - Electric Items | 28 |
| 6. | හවුස් හෝල්ඩ් - House Holds | 45 |
| 7. | ට්‍රැවලිං බෑග් - Travelling Bags | 73 |

| කුඩ - **Umbrella** | | |
|---|---|---|
| *අයිතම අංකය Item No.* | *අයිතම නාමය Item Name* | *ප්‍රමාණය Qty* |
| 1. | කුඩ - Umbrellas | 132 |

| සාරි අංශය - **Saree Department** | | |
|---|---|---|
| 1. | සාරි - Sarees | 538 |
| 2 | කැෂුවල් සාරි - Casual Sarees | 327 |
| 3. | කොටන් සාරි - Cotton Sarees | 288 |
| 4. | සාරි අන්ඩර්ස්කර්ට් - Saree Underskirts | 80 |
| 5. | සල්වාරි - Salvaries | 422 |

| මැටීරියල් - **Materials** | | |
|---|---|---|
| 1. | මැටීරියල් - Materials | 2,212 |

| කොස්මෙටික් අංශය - **Cosmetic Department** | | |
|---|---|---|
| 1. | ලේඩීස් කොස්මෙටික් - Ladies Cosmetics | 834 |
| 2. | ජෙනට්ස් කොස්මෙටික් - Gents Cosmetics | 568 |
| 3. | ඉම්පෝටඩ් ලේඩීස් කොස්මෙටික් - Imported Ladies Cosmetics | 217 |
| 4. | ඉම්පෝටඩ් ජෙන්ට්ස් කොස්මෙටික් - Imported Gents Cosmetic | 375 |

සහ ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 176, වත්තල ග්‍රාම සේවා කොට්ඨාසයේ, හැඳල හන්දියේ, මීගමුව පාරේ, අංක 493/A දරන ස්ථානයේ දැනට තබා තිබෙන සහ ගබඩා කර ඇති සහ යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන තොග මත නිමි භාණ්ඩ නොනිමි භාණ්ඩ වෙනත් සියලු චංචල දේපළ, කලින් කල හා සෑම කල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ තොග මත වෙනත් නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ සහ සියලු චංචල දේපළ සහ මින්මතු මේ බැඳුම්කරය බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය යුතු හා තිබිය හැකි සමාගමේ තොග මත වෙනත් නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ භාණ්ඩ සහ සියලු චංචල දේපළ සහ සමාගම විසින් මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, සහ නැව්ගත කිරීමේ අපේක්ෂාවෙන් හෝ වාප්පුවේදී හෝ ගබඩාවේදී නිශ්කාෂණය කිරීමේ අපේක්ෂාවෙන් එකී ජනරජයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයට හෝ ගෙන එනු ලැබිය හැකි, සමාගමේ එකී තොග මත නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ සහ ව්‍යාපාර චංචල දේපළ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

03-185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.